# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## ஆண்டிற்கான செயற்திறன் அறிக்கை

## ANNUAL PERFORMANCE REPORT

# 2018

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

**காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்**

**Land Commissioner General's Department**

## ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

ගරු ගයන්ත කරුණාතිලක
අමාත්‍ය, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

ගරු ටී.බී. ඒකනායක
රාජ්‍ය අමාත්‍ය, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

ගරු දුනේෂ් ගන්කන්ද
නියෝජ්‍ය අමාත්‍ය, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

ගරු එඩ්වඩ් ගුණසේකර
නියෝජ්‍ය අමාත්‍ය, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

ඩබ්.එච්. කරුණාරත්න මයා
ලේකම්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ආර්.එම්.සී.එම්. හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්

ඩබ්.ඩබ්.ඒ. චන්ද්‍රා
ඉඩම් කොමසාරිස් (I)

පී.ඩී. ඉන්දිකා එල්. විජේගුණවර්ධන
ඉඩම් කොමසාරිස් (II)

එල්.ඒ. ජයසිංහ
ඉඩම් කොමසාරිස් (III)

සුසීමා කාරියවසම්
ඉඩම් කොමසාරිස් (පාලන)

ආර්.පී.ඩී.එස්.ඩී. පෙරේරා
ප්‍රධාන ගණකාධිකාරී

ඒ.ටී.සිවපාතසුන්දරම්
ප්‍රධාන අභ්‍යන්තර විගණක

**පටුන** **පිටු අංක**


**1. පරිච්ඡේදය - හැඳින්වීම** **6- 9**

1.1 දැක්ම
1.2 මෙහෙවර ප්‍රකාශය
1.3 අරමුණ
1.4 කාර්යයන්

**2. පරිච්ඡේදය - සංවිධාන සටහන** **10 - 10**

**3. පරිච්ඡේදය - මානව සම්පත් කළමනාකරණය** **11 - 20**

3.1 කාර්ය මණ්ඩල සංයුතිය
3.2 ආයතනික කටයුතු
3.3 මානව සම්පත් සංවර්ධනය

**4. පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය** **21 - 26**

4.1 වැය ඇස්තමේන්තුව
4.2 අත්තිකාරම් බී ගිණුම
4.3 ආදායම් ගිණුම
4.4 භෞතික සම්පත් කළමනාකරණය
4.5 ගබඩා සමීක්ෂණය
4.6 විගණන කටයුතු

**5. පරිච්ඡේදය - සංවර්ධන කටයුතු** **27 - 38**

5.1 ඉඩම්
5.2 බදු
5.3 අනුයුක්ත ආයතන පිළිබඳ තොරතුරු

**1. පරිච්ඡේදය**

**හැඳින්වීම**

## 1.1 දෙපාර්තමේන්තු දැක්ම

"රාජ්‍ය ඉඩම්

කළමනාකරණයේ

ප්‍රමුඛයා ලෙස

නිරවුල්

බිමක් හිමි

සමාජයක්

බිහිකිරීම"

## 1.2 මෙහෙවර ප්‍රකාශය

"ජාතික ප්‍රතිපත්තියක් තුල

මනා සම්බන්ධීකරණයකින් යුතුව

සංවර්ධනයේ චිරස්ථායී බව සහතික කරමින්

රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින්

භාවිතා කිරීමට මඟ පෙන්වමින්

නිරවුල් බිමක අයිතිය තහවුරු කෙරෙන

විධිමත් කළමනාකාරීත්වයක්

පවත්වා ගෙන යෑම"

## 1.3 දෙපාර්තමේන්තුවේ අරමුණු හා උපාය මාර්ග


| අරමුණු | උපාය මාර්ග |
|---|---|
| 1 ඉඩම් නොමැති ප්‍රජාවගේ ඉඩම් භුක්තිය ශක්තිමත් කිරීම. | i ඉඩම් හිමිකම තහවුරු කිරීම.<br>ii රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු කළමනාකරණය කිරීම. |
| 2 ආයෝජන අවස්ථා පුළුල් කිරීම. | i ආයෝජන අවස්ථා පුළුල් කිරීම සඳහා රජයේ ඉඩම් උපයෝජනය කිරීම. |
| 3 රජයේ ඉඩම් ප්‍රශස්ථ භාවිතය. | i රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් සංවර්ධනය කිරීම.<br>ii රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම. |
| 4 දෙපාර්තමේන්තුව සතු සම්පත් ප්‍රශස්ථව කළමනාකරණය කිරීම . | i මානව සම්පත සංවර්ධනය කිරීම.<br>ii භෞතික සම්පත ඵලදායි ලෙස භාවිතා කිරීම.<br>iii මූල්‍ය සම්පත විධිමත්ව කළමනාකරණය කිරීම. |
| 5 රාජ්‍ය ආදායම වර්ධනය කිරීමට දායකවීම | i ඉඩම් ආදායම් හඳුනාගැනීම හා ඇස්තමේන්තු කිරීම<br>ii ඉඩම් ආදායම් කාර්යක්ෂමව හා විධිමත්ව රැස්කිරීම.<br>iii හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල පියවර ගැනීම. |

## 1.4 ඉඩම් පරිපාලනය තුල ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

ඉඩම් කළමනාකරණයේ ප්‍රමුඛයා ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව රජයේ ඉඩම් බැහැර කිරීමේදී සුවිශේෂී වූ කාර්ය භාරයක් ඉටුකරනු ලබයි.

01. අන්තර් පළාත් වාරිමාර්ග හා ඉඩම් සංවර්ධන ව්‍යාපෘති කළමනාකරණය කිරීම.
02. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් බෙදාදීම හා බෙදා දුන් ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීම.
03. රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් බෙදාදීම, මේ යටතේ
    - නිවාස, කෘෂිකාර්මික, කර්මාන්ත හා වාණිජ කටයුතු සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාදීම.
    - විශේෂ හා නිදහස් දීමනා පත්‍ර නිකුත් කිරීම.
    - විහාරස්ථාන සඳහා පූජා භූමි ඔප්පු නිකුත් කිරීම.
    - රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය ඉඩම් නිදහස් කිරීම, බදු දීම හා පැවරීම.
04. ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉඩම් බෙදාදීම හා දීමනාපත්‍ර නිකුත් කිරීම.
05. රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ රජයේ ඉඩම් හා රක්ෂිත ආරක්ෂා කිරීම
06. අන්තර් පළාත් ඉඩම් සංවර්ධන ව්‍යාපෘති වලින් බැහැර රජයේ ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දීම.
07. රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණය කිරීම.
08. රාජ්‍ය බදු ආදායම් ශක්තිමත් කිරීමට රජයේ ඉඩම් මත බදු අයකර ගැනීම කළමනාකරණය කිරීම
09. මානව සම්පත් සංවර්ධන කටයුතු පවත්වා ගෙනයාම.
10. ඉඩම් ආරවුල් නිරාකරණය කිරීම.

## 2 පරිච්ඡේදය
## සංවිධාන සටහන



## 3. පරිච්ඡේදය
## මානව සම්පත් කළමණාකරණය

### 3.1 කාර්ය මණ්ඩල සංයුතිය

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශිය කාර්යාල 08 කින්, සමන්විත වේ. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්මේන්තුවේ ප්‍රධානියා ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා කටයුතු කරනු ලබයි. ඒ අනුව ඉඩම් අංශය I, ඉඩම් අංශය II, ඉඩම් අංශය III, පාලන අංශය, ගිණුම් අංශය හා අභ්‍යන්තර විගණන අංශය වශයෙන් අංශ 06 ක් ප්‍රධාන කාර්යාලය තුළ ක්‍රියාත්මක වේ. මෙයින් ප්‍රධාන අංශ 04 ක ප්‍රධානීන් ලෙස ඉඩම් කොමසාරිස්වරු කටයුතු කරනු ලබන අතර ගිණුම් අංශයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන ගණකාධිකාරි ද, අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා ලෙස අභ්‍යන්තර විගණනක ද කටයුතු කරනු ලැබේ. අන්තර් පළාත් වාරිමාර්ග ක්‍රම යටතේ පිහිටුවා තිබෙන්නා වූ ප්‍රාදේශිය කාර්යාලවල කටයුතු ඉඩම් කොමසාරිස් හෝ සහකාර ඉඩම් කොමසාරිස්වරු යටතේ කටයුතු සිදු කරනු ලබයි.

**කාර්ය මණ්ඩල සංයුතිය**

| අනු අංකය | අනුමත තනතුරු නම | තනතුරු සංඛ්‍යාව | 2017 වර්ෂයේ සිටි තනතුරු සංඛ්‍යාව | වර්ෂය තුළ සිදු වූ වෙනස් වීම් | | | | | 2018 වර්ෂයේ සිටි තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විශ්‍රාම යෑම් | ස්ථාන මාරු | | බඳවා ගැනීම් | උසස් වීම් | |
| | | | | | ගිය | පැමිණි | | | |
| 1 | ඉඩම් කොමසාරිස් ජනරාල් | 1 | 1 | - | - | - | - | - | 1 |
| 2 | ඉඩම් කොමසාරිස් | 10 | 4 | - | 1 | 1 | - | - | 4 |
| 3 | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | - | 1 | 1 | - | - | 1 |
| 4 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | - | - | - | - | - | 1 |
| 5 | සහකාර / නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් | 24 | 24 | - | 4 | 4 | - | - | 24 |
| 6 | ගණකාධිකාරී | 3 | 2 | - | - | - | - | - | 2 |
| 7 | මිනින්දෝරු | 9 | 9 | 1 | | | | | 8 |
| 8 | නීති නිලධාරී | 2 | 1 | - | 1 | 1 | - | - | 1 |
| 9 | පරිපාලන නිලධාරී | 2 | 1 | 1 | - | - | - | - | 0 |
| 10 | ජනපද නිලධාරී(විශේෂ ශ්‍රේණිය) | 31 | 6 | 1 | - | - | - | - | 7 |
| 11 | ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරී | 2 | 1 | - | - | - | - | - | 1 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 12 | භාෂා පරිවර්තක | 2 | 1 | - | - | - | - | - | 1 |
| 13 | සමාජ විද්‍යාඥ | 1 | 1 | - | - | - | - | - | 1 |
| 14 | සංවර්ධන සහකාර / නිළධාරි | 260 | 157 | - | 3 | 5 | - | - | 154 |
| 15 | වැඩ අධිකාරි | 21 | 4 | 2 | - | - | - | - | 3 |
| 16 | ජනපද නිලධාරි | 204 | 96 | 7 | - | 1 | - | - | 89 |
| 17 | සැලසුම් ශිල්පී | 1 | 0 | - | - | - | - | - | 0 |
| 18 | කළමනාකරණ සහකාර | 160 | 117 | 8 | 22 | 8 | 50 | 1 | 145 |
| 19 | ක්ෂේත්‍ර උපදේශක | 22 | 22 | - | - | - | - | - | 22 |
| 20 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 5 | 2 | - | - | - | - | - | 2 |
| 21 | ලේඛණ භාරකරු | 1 | 1 | 1 | - | - | - | - | 0 |
| 22 | රියදුරු | 32 | 30 | - | 3 | 1 | - | - | 28 |
| 23 | මෝටර් කාර්මික | 1 | 1 | - | - | - | - | - | 1 |
| 24 | කාර්යාල කාර්ය සහායක | 32 | 32 | - | 3 | 1 | - | - | 30 |
| 25 | කාර්යාල කම්කරු | 15 | 15 | 2 | - | - | - | - | 13 |
| 26 | සංචාරක බංගලා භාරකරු | 8 | 4 | 0 | 1 | - | 2 | - | 5 |
| 27 | සංචාරක බංගලා කම්කරු | 8 | 3 | - | - | - | 4 | - | 7 |
| 28 | මැනුම් සහායක | 27 | 11 | - | - | 1 | - | - | 11 |
| 29 | ගබඩාකරු | 1 | 1 | 1 | - | - | - | - | 0 |
| 30 | මුරකරු | 16 | 14 | - | - | - | - | - | 14 |
| **එකතුව** | | **903** | **563** | **24** | **39** | **24** | **56** | **1** | **576** |

තනතුරු කිහිපයක අනුමත තනතුරු සංඛ්‍යාවට වඩා සේවය කරන නිලධාරීන් ප්‍රමාණය අඩු නිසා තනතුරු පුරප්පාඩු දක්නට ලැබුණි. ඒ අනුව ජනපද නිලධාරි, සංවර්ධන සහකාර, කළමනාකරණ සහකාර යන තනතුරුවල තනතුරු පුරප්පාඩු 2018 වර්ෂයේදී දක්නට ලැබුණි.

වර්ෂයේ ස්ථාන මාරු වී ගිය හා පැමිණි ගණන

| අනු අංකය | නම හා තනතුර | ස්ථාන මාරු වී ගිය | | ස්ථාන මාරු වී පැමිණි | |
|---|---|---|---|---|---|
| | | දිනය | රාජකාරි ස්ථානය | දිනය | රාජකාරි ස්ථානය |
| 1 | පී.කේ. දයාශාන්ත මයා - ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය 1 ශ්‍රේණිය | 2018-07-10 | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | - | - |
| 2 | ඊ.ඒ.ආර්. රේණුකා මිය - ඉඩම් කොමසාරිස් ඉඩම් III | 2018-09-20 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | - | - |
| 3 | කේ. ජගන්නාත් මයා - ශ්‍රී ලංකා පරිපාලන සේවය III ශ්‍රේණිය | 2018-05-31 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | - | - |
| 4 | කේ.ජී.ඒ.කේ. පලුගස්වැව මයා - ශ්‍රී ලංකා පරිපාලන සේවය III ශ්‍රේණිය | 2018-05-09 | ජනාධිපති ලේකම් කාර්යාලය | - | - |
| 5 | එන්.එම්.ඩී.ටී.එම්. ජයතිලක මෙය - ශ්‍රී ලංකා පරිපාලන සේවය III ශ්‍රේණිය | 2018-03-08 | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, කුණ්ඩසාලේ | - | - |
| 6 | ජේ.ඒ. ගර්ලි මිය - ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය III ශ්‍රේණිය | 2018-01-30 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | - | - |
| 7 | ඩබ්.ඩී.පී.එච්. විතාන මිය - නීති නිලධාරි | 2018-07-25 | කර්මාන්ත හා වාණිජකටයුතු අමාත්‍යාංශය | - | - |
| 8 | එච්.ජී. රංජනි මිය - සංවර්ධන නිළධාරි III | 2018-07-11 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - | - |
| 9 | එම්.එච්.අයි.අලී මයා - සංවර්ධන නිළධාරි III | 2018-06-29 | වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය | - | - |
| 10 | ඊ.එම්. හර්ෂි මෙය - සංවර්ධන නිළධාරි III | 2018-06-08 | බස්නාහිර පළාත් රජ්‍ය සේවය | - | - |
| 11 | බී.එස්.පී. ප්‍රියදර්ශනි මිය - සංවර්ධන නිළධාරි III | 2018-05-16 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | - | - |
| 12 | ජී.ඩබ්.ජී.ඒ.බී. ගංගොඩ මයා - සංවර්ධන නිළධාරි III | 2018-05-10 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | - | - |
| 13 | එච්.එම්. විජිතා මල්කාන්ති මිය - සංවර්ධන සහකාර (ඉඩම්) | 2018-03-14 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | - | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 14 | ඩී. පියතිස්ස මයා - සංවර්ධන සහකාර (ඉඩම්) | 2018-03-02 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | - | - |
| 15 | එච්.එම්.සී.එම්. අබේවර්ධන මයා - සංවර්ධන සහකාර (ඉඩම්) | 2018-02-14 | ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු ආයතනය | - | - |
| 16 | ජී.එම්.කේ.සී. ජයන්ති මිය - රා.ක.ස. I | 2018-05-31 | ආගමන විගමන දෙපාර්තමේන්තුව | - | - |
| 17 | කේ.එන්. කළුපහන මිය - රා.ක.ස I | 2018-03-13 | කාර්මික විද්‍යාල, හෝමාගම | - | - |
| 18 | එම්.එන්. රණසිංහ මිය - රා.ක.ස. I | 2018-05-31 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | - | - |
| 19 | එල්.ඩී.සී. රම්‍යලතා මිය- රා.ක.ස. I | 2018-05-11 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හෝමාගම | - | - |
| 20 | කේ. ප්‍රේමලතා මිය - රා.ක.ස. I | 2018-03-05 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තිස්සමහාරාමය | - | - |
| 21 | ජේ.ජී.ඩබ්. ගයානි ජයලත් මිය - රා.ක.ස. I | 2018-03-09 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල | - | - |
| 22 | එම්. ජයන්ත මයා - රා.ක.ස. I | 2018-03-05 | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | - | - |
| 23 | ඩබ්.එන්.එස්. අල්විස් මිය - රා.ක.ස. I | 2018-03-05 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | - | - |
| 24 | එස්.කේ.පී. සමරකෝන් මිය - රා.ක.ස. II | 2018-06-01 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාතලේ | - | - |
| 25 | ජී.ඒ.සී.පී. ලියනගේ මිය - රා.ක.ස. III | 2018-09-06 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | - | - |
| 26 | ඩබ්.ඒ.එල්.එන්. ගුණරත්න මිය - රා.ක.ස. III | 2018-08-20 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | - | - |
| 27 | එල්.ආර්.සී.ඩී. ලක්මාලි මිය - රා.ක.ස. III | 2018-06-01 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වරකාපොළ | - | - |
| 28 | ආර්.එෆ්. රුක්සානා මෙය - රා.ක.ස. III | 2018-06-01 | පොලිස් මූලස්ථානය, පුත්තලම | - | - |
| 29 | ඒ.බී.එම්. අර්ෂාඩ් මයා - රා.ක.ස. III | 2018-06-01 | නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය, අම්පාර | - | - |
| 30 | ඩබ්.ඒ.ටී.එන්. බණ්ඩාර මිය - රා.ක.ස. III | 2018-05-31 | ආගමන විගමන දෙපාර්තමේන්තුව | - | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 31 | කේ.ඒ.බී.එම්. එදිරිසිංහ මිය - රා.ක.ස. III | 2018-05-31 | ආගමන විගමන දෙපාර්තමේන්තුව | - | - |
| 32 | ඩබ්.එම්.සී.එන්.එන්. විජේකෝන් මිය - රා.ක.ස. III | 2018-05-31 | ආගමන විගමන දෙපාර්තමේන්තුව | - | - |
| 33 | ඩබ්.ඒ.අයි.එන්. වීරකෝන් මිය - රා.ක.ස. III | 2018-05-31 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | - | - |
| 34 | කේ.ඒ.එස්. නිලක්ෂි මෙය - රා.ක.ස. III | 2018-05-31 | කම්කරු දෙපාර්තමේන්තුව | - | - |
| 35 | කේ.ටී.එන්. අමරතුංග - රා.ක.ස. III | 2018-05-31 | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | - | - |
| 36 | ජේ.ඊ.ආර්. සුරේනි මිය - රා.ක.ස. | 2018-03-02 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තිස්සමහාරාමය | - | - |
| 37 | ජී.එච්. ලමාහේවා මිය | 2018-03-07 | අනුරාධපුර ශික්ෂණ රෝහල | - | - |
| 38 | එච්.ඒ.එස්.ඩී. ඕපනායක මිය | 2018-03-02 | මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | - | - |
| 39 | ආර්.එම්.එන්.ටී. රත්නායක මිය - රා.ක.ස. II | 2018-03-12 | කෘෂි විද්‍යාලය - අනුරාධපුරය | - | - |
| 40 | යූ.එම්.කේ.අයි. බණ්ඩාර මයා - රා.ක.ස. III | 2018-05-16 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පන්විල | - | - |
| 41 | ඩබ්.අයි.එස්. වික්‍රමසිංහ මිය - කා.කා.සේ. III | 2018-04-10 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අලව්ව | - | - |
| 42 | කේ.ජී.කේ. ගුණවර්ධන මෙය - කා.කා.සේ. III | 2018-05-14 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | - | - |
| 43 | පී.ඒ. කරුණාරත්න මෙය - කා.කා.සේ. III | 2018-04-04 | කම්කරු දෙපාර්තමේන්තුව | - | - |
| 44 | එස්.ඩබ්.කේ.එස්. වීරසූරිය මිය - කා.කා.සේ. III | 2018-04-03 | කාන්ත හා ළමා කටුතු අමාත්‍යාංශය | - | - |
| 45 | එල්.කේ.යූ. තේජානි මිය - රා.ක.ස. III | 2018-03-05 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට | - | - |
| 46 | ඩී.එම්. නන්දන සම්පත් මයා - කා.කා.ස. III | 2018-03-29 | අධිකරණ අමාත්‍යාංශය | - | - |
| 47 | ටී.පී.ටී.කේ. සිරිසේන මයා - කා.කා.ස. III | 2018-06-01 | ජාතික ජල සම්පාදන දෙපාර්තමේන්තුව | - | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 48 | යූ.ආර්. සමරනායක මයා - රියදුරු III | 2018-05-09 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොල්පිතිගම | - | - |
| 49 | එස්.ඒ. විජිත මයා - රියදුරු III | 2018-03-21 | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | - | - |
| 50 | එස්.එම්.එන්. නිහාල්සිරි මයා - රියදුරු III | 2018-03-12 | වවුනියාව දිසා වන නිලධාරි කාර්යාලය | - | - |
| 51 | එල්.ඒ. ජයසිංහ මිය - ශ්‍රී ලංකා පරිපාලන සේවය 1 ශ්‍රේණිය | 2018-11-01 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, රත්මලාන | - | - |
| 52 | ඩී.එම්.යූ.අයි.එන්.කේ. දිසානායක මයා - ශ්‍රී ලං.ප.සේ. I ශ්‍රේණිය | - | - | 2018-03-06 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය |
| 53 | එන්.ඒ.බී.එම්. නිලවක ආරච්චි මිය- ශ්‍රී ලං.ප.සේ. III ශ්‍රේණිය | - | - | 2018-03-02 | පළාත් පාලන අමාත්‍යාංශය |
| 54 | ටී.යූ.කේ. සටන්නායක මෙය - ශ්‍රී ලං.ප.සේ. III ශ්‍රේණිය | - | - | 2018-02-23 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| 55 | පී. ජම්බුදා මෙය- ශ්‍රී ලං.ප.සේ. III ශ්‍රේණිය | - | - | 2018-02-23 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| 56 | ආර්.පී.ඩී.එස්.ඩී. පෙරේරා මිය - ශ්‍රී ලං.ග.සේ. I ශ්‍රේණිය | - | - | 2018-09-18 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| 57 | පී.කේ. දයාශාන්ත මයා - ශ්‍රී ලං.ග.සේ. I ශ්‍රේණිය | - | - | 2018-02-01 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 58 | එස්.එච්.පී. කාංචන මයා - සංවර්ධන නිලධාරි | - | - | 2018-08-28 | අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය |
| 59 | පී.ජී.එම්. පතිරණ මිය- සංවර්ධන නිලධාරි | - | - | 2018-03-19 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව |
| 60 | ජී.පී.එස්. ආශා මෙය - සංවර්ධන නිලධාරි | - | - | 2018-07-11 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නියාගම |
| 61 | ඩී.කේ. විජේසිංහ මයා - සංවර්ධන නිලධාරි | - | - | 2018-03-02 | ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය |
| 62 | එම්. රිෆාන් මයා - සංවර්ධන නිලධාරි | - | - | 2018-07-02 | වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය |
| 63 | කේ.ඩී.එස්. ධර්මසේන මිය - රා.ක.ස. I | - | - | 2018-04-03 | දේශීය අදායම් දෙපාර්තමේන්තුව |
| 64 | එන්.පී. චම්පා මිය - රා.ක.ස. I | - | - | 2018-03-02 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 65 | එම්.ඒ.එම්. හේමලතා මිය - රා.ක.ස. I | - | - | 2018-03-05 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 66 | පී.ඩී.අයි. රත්නායක මිය - රා.ක.ස. II | - | - | 2018-04-03 | විශාඛා විද්‍යාලය |
| 67 | කේ.ඩී.අයි. ප්‍රනාන්දු මෙය - රා.ක.ස. II | - | - | 2018-03-12 | ආගමන විගමය දෙපාර්තමේන්තුව |
| 68 | ටී.සී. මහවත්තගේ මිය - රා.ක.ස. III | - | - | 2018-06-11 | පොලිස් දෙපාර්තමේන්තුව |
| 69 | එන්. පිරශාන්දන් මයා - රා.ක.ස. | - | - | 2018-03-02 | කම්කරු දෙපාර්තමේන්තුව |
| 70 | ඩබ්. කුසුම් කුමාරි - රා.ක.ස. II | - | - | 2018-03-22 | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 71 | එම්.ජී.එච්.අයි. අබේසිංහ මිය - රා.ක.ස. III | - | - | 2018-03-02 | රේගු දෙපාර්තමේන්තුව |
| 72 | පී.එම්..පී.එස්. කුමාර මයා - කා.කා.සේ. III | - | - | 2018-08-01 | විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යාංශය |
| 73 | ආර්.ජේ.එන්.එන්.එන්.පී.සී. කුමාර මයා - රියදුරු III | - | - | 2018-05-08 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොල්පිතිගම |

## 3.2 ආයතනික කටයුතු

2018 වර්ෂයේ දී 2017 වර්ෂයට සාපේක්ෂව ආයතනික කටයුතු වල වර්ධනයක් දැකගත හැකිවිය. විශේෂයෙන්ම සේවයට බඳවා ගැනීම්, ණය අනුමත කිරීම්, උසස්වීම් ආදිය තුළින් මෙය නිරූපණය වේ.

| අනු අංකය | විස්තරය | **2017** වසර | | | **2018** වසර | | |
|---|---|---|---|---|---|---|---|
| | | ලැබූ සංඛ්‍යාව | අනුමත කළ | ඉතිරි සංඛ්‍යාව | ලැබූ සංඛ්‍යාව | අනුමත කළ | ඉතිරි සංඛ්‍යාව |
| 1 | සේවයට බඳවා ගැනීම් | | 37 | | | 9 | |
| 2 | කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම් | | 3 | | | 2 | |
| 3 | සම්මුඛ පරීක්ෂණපැවැත්වීම් | | 3 | | | 3 | |
| 4 | සේවය ස්ථිර කිරීම් | | 52 | | | 35 | |
| 5 | උසස් කිරීම් | | 12 | | | 65 | |
| 6 | වැටුප් වර්ධක ගෙවීම් | | 212 | | | 229 | |
| 7 | විශ්‍රාම ගැන්වීම් | | 11 | | | 23 | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 8 | සේවය දීර්ඝ කිරීම් | - | - | - | - | - | - |
| 9 | බඳවා ගැනීම් පරිපාටි සැකසීම් | | 2 | | | 8 | |
| 10 | සේවය හැර යෑම් | | 4 | | | 1 | |
| 11 | වැඩ තහනම් කිරීම් | | 1 | | | 4 | |
| 12 | නැවත සේවය පිහිටුවීම් | - | - | - | - | - | - |
| 13 | විනය පරීක්ෂණ | | 1 | | | 5 | |
| 14 | විදේශ නිවාඩු අනුමත කිරීම් | | 4 | | | 13 | |
| 15 | විදේශ ශිෂ්‍යත්ව | | 1 | | | 0 | |
| 16 | ඇප ආරම්භ කිරීම් | | 0 | | | 0 | |
| 17 | ඇප නිදහස් කිරීම් | | 5 | | | 0 | |
| 18 | ණය අනුමත කිරීම් | | | | | | |
| | දේපල | | 6 | | | 0 | |
| | වාහන | | 0 | | | 0 | |
| | ආපදා ණය | | 203 | | | 67 | |

## 3.3 මානව සම්පත් සංවර්ධනය

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන්නා වූ මානව සම්පත සංවර්ධනය සඳහා විවිධ පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලබයි. ඒ අනුව දේශීය මෙන්ම විදේශීය පුහුණු වැඩසටහන්ද මෙමගින් ක්‍රියාත්මක කරනු ඇත. විශේෂයන්ම පුහුණු වැඩසටහන් හරහා කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනයට කටයුතු කරනු ලැබේ. ඒ අනුව 2018 වර්ෂයේ දී පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය සඳහා අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන මුදල් රුපියල් 3,000,000.00 වෙන් වූ අතර ඉන් රුපියල් 2,630,044.90 ක් වියදම් විය. 2018 වර්ෂයේ දී පුහුණු සංවර්ධන වැඩසටහන් පහත සඳහන් අයුරින් දෙපාර්තමේන්තුව මගින් පවත්වා ඇත.

**2018 කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ප්‍රගතිය - දේශීය**

| විෂය | සැලැසුම් කළ පුහුණු වැඩසටහන් ගණන | පවත්වා ඇති පුහුණු වැඩසටහන් ගණන | පුහුණු කිරීමට සැලසුම්කල නිලධාරීන් සංඛ්‍යාව | පුහුණුකළ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| දෙපාර්තමේන්තු මගින් නිලධාරීන් පුහුණු කිරීම | 14 | 15 | 600 | 541 |
| දෙපාර්තමේන්තු නිලධාරීන් පුහුණු ආයතනවලට යොමු කිරීම | | 10 | 600 | 20 |
| එකතුව | **14** | **25** | **1200** | *** 561** |

(* පුහුණු වැඩ සටහන් කිහිපයක් සඳහා එකම නිළධාරියා සහභාගි වී ඇත.)

ඉහත සඳහන් දේශීය පුහුණු කිරීම්වලට අමතරව මානව සම්පත් සංවර්ධනය වඩා ඵලදායි ආකාරයට ලබා ගැනීමේ අරමුණ ඇතිව නිලධාරීන්ට විදේශ පුහුණුවීම් අවස්ථාද ලබා දී ඇත. ඒ පිළිබඳ විස්තර පහත වගු සටහනෙන් පෙන්නුම් කරේ.

**2018 කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ප්‍රගතිය - විදේශීය**

| අනු අංකය | පාඨමාලාව | නිලධාරියාගේ නම | තනතුර | රට | පුහුණු කාල සීමාව | |
|---|---|---|---|---|---|---|
| | | | | | සිට | දක්වා |
| 1 | Kaluganga Reservoir Head Work Project | ආර්.එම්.සී.එම්.හේරත් මිය | ඉඩම් කොමසාරිස් ජනරාල් | චීනය | 2018-04-15 | 2018-04-24 |
| 2 | Colombo Port City Development Project | ආර්.එම්.සී.එම්.හේරත් මිය | ඉඩම් කොමසාරිස් ජනරාල් | චීනය | 2018-09-01 | 2018-09-11 |
| 3 | Regional Foreign Bilateral Work Shop on Strengthing Land Acausition for Public Project | පී.ඩී.අයි.එල්.විජේගුණවර්ධන මිය | ඉඩම් කොමසාරිස් - ඉඩම් I | නේපාලය | 2018-04-15 | 2018-04-20 |
| 4 | 2018 Seminar the Consruction and Management of Industrial Part for Sri Lanka | වයි.වයි.එන්.පෙරේරා මිය | සහකාර ඉඩම් කොමසාරිස් ඉඩම් II | චීනය | 2018-09-25 | 2018-10-15 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 5 | Foreign Training Programme for Official in Sri lankan Administrative Service Indian Public Sector | සි.පී.චාමිකා සුබෝධිනී මිය | සහකාර ඉඩම් කොමසාරිස් ඉඩම් II | ඉන්දියාව | 2018-07-29 | 2018-08-04 |
| 6 | Rules and Contributions of Land Administration | කේ.පී.ටී. ප්‍රේමදාස මිය | සහකාර ඉඩම් කොමසාරිස් ඉඩම් I | මැලේසියාව | 2018-08-26 | 2018-09-08 |
| 7 | Capacity Building Training | ඒ.ටී.එස්.සිවපාතසුන්දරම් මෙය | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ඉන්දියාව | 2018-09-09 | 2018-09-15 |
| 8 | Public Procurement Best Practtices | ඊ.පී.ඩී.අල්විස් මිය | ගණකාධිකාරී - සැපයීම් | ජපානය | 2018-09-09 | 2018-09-19 |
| 9 | National Aerospace Remote Sensing | පී.ඩී.අයි.එල්.විජේගුණවර්ධන මිය | ඉඩම් කොමසාරිස් - ඉඩම් I | චීනය | 2018-10-08 | 2018-10-29 |
| 10 | Public Administration and Development - India | එස්.ඒ.කලානි එම්.ධනසේකර මිය | සහකාර ඉඩම් කොමසාරිස් ඉඩම් II | ඉන්දියාව | 2018-10-21 | 2018-10-27 |
| 11 | Public Administration and Development | සුසිමා කාරියවසම් මිය | ඉඩම් කොමසාරිස් - පාලන | ඉන්දියාව | 2018-11-25 | 2018-12-01 |
| 12 | Public Administration and Development | ඒ.ටී.එස්.සිවපාතසුන්දරම් මෙය | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ඉන්දියාව | 2018-11-25 | 2018-12-01 |

# 4. පරිච්ඡේදය
## මූල්‍ය කළමනාකරණය

### 4.1 වැය ඇස්තමේන්තුව

| 286-02-01 | 2017 | | | වියදමේ ප්‍රතිශතය % | 2018 | | | වියදමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන (රු.) | වියදම (රු) | ඉතිරිය (රු) | | ප්‍රතිපාදන (රු.) | වියදම (රු) | ඉතිරිය (රු) | |
| | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 282,104,000 | 276,213,364 | 5,890,636 | 97.91 | 279,900,000 | 279,370,330 | 529,670 | 99.8 |
| වෙනත් පුනරාවර්තන | 68,660,000 | 65,955,304 | 2,704,696 | 96.06 | 81,940,000 | 75,162,232 | 6,777,768 | 91.7 |
| ප්‍රාග්ධන | 54,200,000 | 34,151,254 | 20,048,746 | 63.01 | 67,500,000 | 40,799,963 | 26,700,037 | 60 |
| **2001** | 30,000,000 | 16,162,417 | 13,837,583 | 53.87 | 32,000,000 | 16,361,078 | 15,638,922 | 51.1 |
| **2002** | 1,200,000 | 1,188,484 | 11,516 | 99.04 | 2,000,000 | 563,926 | 1,436,074 | 28.2 |
| **2003** | 5,500,000 | 3,824,936 | 1,675,064 | 69.54 | 6,500,000 | 3,557,513 | 2,942,487 | 54.7 |
| **2102** | 3,000,000 | 488,234, | 2,511,766 | 16.27 | 4,000,000 | 2,196,222 | 1,803,778 | 54.9 |
| **2104** | 5,000,000 | 4,346,300 | 653,700 | 86.93 | - | - | - | - |
| **2105-1** | 1,000,000 | 727,095 | 272,905 | 72.71 | 2,000,000 | - | 2,000,000 | - |
| **2105-2** | 3,600,000 | 3,579,000 | 21,000 | 99.42 | - | - | - | - |
| **2105-3** | 2,200,000 | 1,160,310 | 1,039,690 | 52.74 | - | - | - | - |
| **2401** | 2,700,000 | 2,674,478 | 25,522 | 99.05 | 3,400,000 | 3,247,745 | 152,255 | 95.5 |
| **2106** | | | | | 17,600,000 | 14,873,479 | 2,726,521 | 84.5 |
| එකතුව | 404,964,000 | 376,319,922 | 28,644,078 | 92.93 | 496,840,000 | 436,132,488 | 60,707,512 | 87.7 |

### 4.2 අත්තිකාරම් බී ගිණුම

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් හා ණය ලබාදීම පිණිස මූල්‍ය පහසුකම් සපයා ගැනීම මෙම අත්තිකාරම් ගිණුම මඟින් සිදුකරනු ලබන අතර ඒ අනුව 2018 වර්ෂය තුළදී ද පහත සඳහන් පරිදි ලැබුණු අත්තිකාරම් හා ණය ඉල්ලුම්පත් සම්පූර්ණ කොට ඇත.

**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම**

| අනු අංකය | ණය වර්ගය | ඉල්ලුම් කළ සංඛ්‍යාව | ලබා දුන් සංඛ්‍යාව | මුදල රු. |
|---|---|---|---|---|
| 01 | විශේෂ ණය අත්තිකාරම් | 132 | 132 | 528,000.00 |
| 02 | උත්සව අත්තිකාරම් | 389 | 389 | 3,890,000.00 |
| 03 | ආපදා ණය | 156 | 129 | 17,327,271.65 |
| 04 | පා පැදි ණය | - | - | - |
| | එකතුව | | | 21,745,271.65 |

නියමිත සීමාවන් පිළිපදිමින් අදාළ අත්තිකාරම් ගිණුම මෙහෙය වූ ආකාරය පසුගිය වසර හා සංසන්දනාත්මකව පහත වගුව මඟින් දක්වා ඇත.

**අත්තිකාරම් ගිණුම මෙහෙයවූ ආකාරය**

| සීමාවන් | 2017 | | | එකතුව B+C | 2018 | | | එකතුව B+C |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව A | තථ්‍ය | | | ඇස්තමේන්තුව A | තථ්‍ය | | |
| | | සීමාවට බලපාන B | සීමාවට බල නොපාන C | | | සීමාවට බලපාන B | සීමාවට බල නොපාන C | |
| වියදමේ උපිරිම සීමාව | 21,000,000.00 | 20,346,710.18 | 2,131,441.00 | 22,478,151.18 | 25,000,000.00 | 21,745,271.65 | 4,494,199.16 | 26,239,470.81 |
| අවම බැර සීමාව | 15,200,000.00 | 16,357,698.76 | 3,602,176.00 | 19,959,874.76 | 15,200,000.00 | 15,789,810.20 | 7,206,203.52 | 22,996.013.72 |
| උපරිම හර ශේෂ සීමාව | 80,000,000.00 | 55,493,198.59 | - | 55,493,198.59 | 90,000,000.00 | 5,955,461.46 | (2,712,004.36) | 58,696,126.95 |

## 4.3 ආදායම් ගිණුම

| | **පෙර වර්ෂය<br>රු.මිලි.** | **ප්‍රවර්ථන වර්ෂය<br>රු.මිලි.** |
|---|---|---|
| **ඇස්තමේන්තුව (රු)** | 46,000,000 | 65,000,000.00 |
| වර්ෂයේ ආදායම (රු) | 70,132,249 | 55,324,037.41 |
| වෙනස (+/-) | (25,132,249) | 9,675,962.59 |

## 4.4 භෞතික සම්පත් කළමනාකරණය

**භෞතික සම්පත් සංයුතිය හා සිදු වූ වෙනස්කම් සහ ප්‍රසම්පාදන කටයුතු,**

**භාණ්ඩ අපහරණය**

නිශ්චල වත්කම් කාණ්ඩය යටතේ නව ගොඩනැගිලි ඉදිකිරීම් සිදු නොකිරිම හා දෙපාර්තමේන්තුවට නව ඉඩම් අත්පත් කර ගැනීම් නොකිරිම නිසා 2017 වර්ෂයේ මෙන්ම 2018 වර්ෂයේදී නිශ්චල වත්කම් කාණ්ඩයේ ශේෂයන් ස්ථාවරව පැවැතුණි.

නිශ්චල දේපල

| අනු අංකය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවැති තත්වය | වර්ෂය තුළ සිදුවන ලද වෙනස් වීම් | | | | වසර අවසානයේ පැවැති තත්වය |
|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත්කර ගැනීම් | මිළදී ගැනීම් | වෙන්දේසි කිරීම | පැවරීම | |
| 01 | ඉඩම්(හෙක්.) | 88.4 | - | - | - | - | |
| 02 | ගොඩනැගිලි | 250 | - | - | - | - | 250 |
| 03 | ඉදිකිරීම් | - | - | - | - | - | |

චංචල දේපල

| අනු අං කය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවැති තත්වය | වර්ෂය තුළ සිදුවනලද වෙනස්වීම් | | | | වසර අවසානයේදී පැවැති තත්වය ** |
|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත් කර ගැනීම් | මිළ දී ගැනීම | වෙන් දේසි කරීම | අපහ රණය | |
| 01 | කැබ් රථ | 29 | | | | | 14 |
| 02 | මෝටර් රථ (ජීප් රථ සහ කාර්) | 13 | | | | | 09 |
| 03 | පාගන සයිකල් | 09 | | | | | 02 |
| 04 | ඡායා පිටපත් යන්ත්‍ර | 11 | | | | | 23 |
| 05 | පරිගණක | 78 | | 15 | | | 353 |
| 06 | පරිගණක ප්‍රින්ටර්ස් | 55 | | | | | 97 |
| 07 | ෆැක්ස් යන්ත්‍ර | 17 | | 01 | | | 15 |
| 08 | යතුරු ලියන | 32 | | | | | 27 |
| 09 | සේප්පු | 05 | | | | | 02 |
| 10 | රූපවාහිනී යන්ත්‍ර | 15 | | | | | 09 |
| 11 | ශීතකරණ | 07 | | | | | 03 |
| 12 | අල්මාරි (වානේ හා ලී) | 161 | | 26 | | | 227 |
| 13 | මේස (වානේ හා ලී) | 463 | | | | | 645 |
| 14 | පුටු | 522 | | | | | 1080 |
| 15 | රාක්ක | 221 | | | | | 82 |
| 16 | ස්ටෑන්ඩ් ෆෑන් | 06 | | 03 | | | 35 |
| 17 | රෝනියෝ මැෂින් | 04 | | | | | 25 |
| 18 | විදුලි කේතල | 15 | | 03 | | | 16 |
| 19 | පිල්ටර් | 31 | | | | | 26 |
| 20 | රයිස් කුකර් | 02 | | | | | 04 |
| 21 | ගෑස් ලිප් | 08 | | | | | 08 |
| 22 | වායු සමීකරණ | 24 | | | | | 09 |
| 23 | ඉස්ත්‍රික්ක | 07 | | | | | 03 |
| 24 | බ්ලෙන්ඩර් | 03 | | | | | 02 |
| 25 | ගණක යන්ත්‍ර | 128 | | 11 | | | 02 |
| 26 | වැකුම් ක්ලීනර් | 06 | | 02 | | | 03 |
| 27 | පොලිෂර් | 03 | | | | | 02 |
| 28 | තණකොළ කපන යන්ත්‍ර | 04 | | | | | 01 |
| 29 | ඉලෙක්ට්‍රික් ග්‍රිල් හැමැර් | 01 | | | | | 01 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 30 | ඩිජිටල් කැමරා | 01 | | | | | 01 |
| 31 | ඇඳන් (තේක්ක) | 11 | | | | | 04 |
| 32 | මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් | 0 | | | | | 01 |
| 33 | වැරන්ඩා පුටු | 12 | | | | | 10 |
| 34 | සෝෆා සෙට් | 03 | | | | | 02 |
| 35 | අයන් ටේබල් | 03 | | 01 | | | 04 |
| 36 | රූපවාහිනී රදවන | 01 | | 01 | | | 05 |
| 37 | දිග බංකු | 17 | | | | | 42 |
| 38 | ඇඳන් | 14 | | | | | 23 |
| 39 | ගෑස් සිලින්ඩර් | 04 | | | | | 04 |
| 40 | කණ්නාඩි මේස | 15 | | | | | 04 |
| 41 | බිත්ති ඔරලෝසු | 01 | | | | | 08 |
| 42 | විවේක පුටු | 07 | | | | | 04 |
| 43 | වයිට් බෝඩ් | 01 | | | | | 04 |
| 44 | ඉනිමග | 04 | | | | | 02 |
| 45 | බොයිලේරු | 01 | | | | | 02 |
| 46 | පිගන් රාක්ක | 0 | | | | | 02 |
| 47 | ස්කෑනර් | 02 | | 03 | | | 11 |
| 48 | රිචාජබල් ටෝච් | 02 | | | | | 02 |
| 49 | ලොබි ස්ටූල් | 01 | | | | | 11 |
| 50 | කබඩ් | 05 | | | | | 117 |
| 51 | ටවල් රැක් | 06 | | | | | 09 |
| 52 | මෙට්ට | 24 | | | | | 14 |
| 53 | ෆයිල් කැබිනට් | 53 | | 02 | | | 205 |
| 54 | වතුර මෝටර් | 01 | | 01 | | | 16 |
| 55 | දොර පියවිල්ල | 03 | | | | | 02 |
| 56 | ටීපෝ | 01 | | | | | 05 |
| 57 | බෙඩ් සයිඩ් ස්ටූල් | 01 | | | | | 01 |
| 58 | කැබිනට් (Display) | 01 | | | | | 02 |
| 59 | පිළි ගැනීමේ මේස | 01 | | | | | 01 |
| 60 | වතුර පිල්ටර් ස්ටෑන්ඩ් | 07 | | | | | 10 |
| 61 | AC යන්ත්‍ර | 01 | | | | | 09 |

** **සිගාස් ගිණුම් පද්ධතිය අනුව 2018/12/31 දිනට ගලපන ලද ශේෂයන් වේ.**

## 4.5 ගබඩා සමීක්ෂණය

ගබඩා කළමනාකරණය, ගබඩා සමීක්ෂණ වාර්ෂික තොග පොත් තබා ගනිමින් සිදු කරනු ලබයි. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යාලය හා උප කාර්යාල මට්ටමින් මෙම කටයුතු සාර්ථකව සිදු කර ඇත.

**ගබඩා සමීක්ෂණ**

| අනු අංකය | කාර්යාලය | භාණ්ඩ සමීක්ෂණය කළ කාර්යාල ගණන |
|---|---|---|
| 01 | ප්‍රධාන කාර්යාලය | 6 |
| 02 | රත්මලාන ලෝක ආහාර ගබඩාව | 1 |
| 03 | මීපිළිමාණ සංචාරක බංගලාව | 1 |
| 04 | අනුරාධපුර ඉඩම් කොමසාරිස් කාර්යාලය | 1 |

| | | |
|---|---|---|
| 05 | අනුරාධපුර සංචාරක බංගලාව | 1 |
| 06 | අනුරාධපුර උප කාර්යාල | 32 |
| 07 | පොළොන්නරුව ඉඩම් කොමසාරිස් කාර්යාලය | 1 |
| 08 | පොළොන්නරුව සංචාරක බංගලාව | 1 |
| 09 | පොළොන්නරුව උප කාර්යාලය | 13 |
| 10 | ත්‍රිකුණාමලය ඉඩම් කොමසාරිස් කාර්යාලය | 1 |
| 11 | ත්‍රිකුණාමලය උප කාර්යාල | 8 |
| 12 | කන්තලේ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය | 1 |
| 13 | කන්තලේ සංචාරක බංගලාව | 1 |
| 14 | කන්තලේ උප කාර්යාලය | 6 |
| 15 | දෙබරවැව ඉඩම් කොමසාරිස් කාර්යාලය | 1 |
| 16 | කතරගම සංචාරක බංගලාව | 1 |
| 17 | හම්බන්තොට සංචාරක බංගලාව | 1 |
| 18 | දෙබරවැව උප කාර්යාලය | 8 |
| 19 | මහියංගනය ඉඩම් කොමසාරිස් කාර්යාලය | 1 |
| 20 | මහියංගනය සංචාරක බංගලාව | 1 |
| 21 | මහියංගනය උප කාර්යාල | 16 |
| 22 | අම්පාර ඉඩම් කොමසාරිස් කාර්යාලය | 1 |
| 23 | අම්පාර (උහන) සංචාරක බංගලාව | 1 |
| 24 | අම්පාර උප කාර්යාල | 14 |
| 25 | මොණරාගල සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය | 1 |
| 26 | මොණරාගල සංචාරක බංගලාව | 1 |
| 27 | මොණරාගල උප කාර්යාලය | 4 |
| | **එකතුව** | **125** |

## 4.6 විගණන කටයුතු

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ විගණන කටයුතු වාර්ෂිකව රජයේ විගණන දෙපාර්තමේන්තුව විසින් හා දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලබයි. අභ්‍යන්තර විගණනය සහ රජයේ විගණන කටයුතු සාපේක්ෂව සිදු කර ඇති ආකාරය පහත වගු සටහන් මඟින් දක්වා ඇත.

**අභ්‍යන්තර විගණන කටයුතු**

| | **2016** | **2017** | **2018** |
|---|---|---|---|
| පැවැත්වූ විගණන පරීක්ෂණ ගණන | 19 | 21 | 20 |
| ඉන් වසර තුළ පිළිතුරු සැපයූ ගණන | 16 | 20 | 18 |

2018, වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මේ අඩංගු ක්‍රියාකාරකම් අනුව අභ්‍යන්තර විගණන පරීක්ෂණ 20 ක් පරීක්ෂා කිරීමට සැලසුම් කල අතර 2018 වර්ෂය අවසන් වන විට අභ්‍යන්තර විගණන පරීක්ෂණ 18 ක් අවසන් කිරීමට හැකියාව ලැබුණි. එම පරීක්ෂණ පැවැත්වූ කාර්යාල/අංශ පිළිබඳ විස්තර පහතින් දක්වා ඇත.

ප්‍රාදේශිය කාර්යාල.

1. ඉඩම් කොමසාරිස් කාර්යාලය - අනුරාධපුරය
2. ඉඩම් කොමසාරිස් කාර්යාලය - පොලොන්නරුව
3. ඉඩම් කොමසාරිස් කාර්යාලය - අම්පාර
4. ඉඩම් කොමසාරිස් කාර්යාලය - මහියංගනය
5. ඉඩම් කොමසාරිස් කාර්යාලය - දෙබරවැව
6. ඉඩම් කොමසාරිස් කාර්යාලය - ත්‍රිකුණාමලය
7. සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය - මොනරාගල
8. සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය - කන්තලේ
9. සංචාරක බංගලාව - නුවරඑළිය
10. ලෝක ආහාර ගබඩාව - රත්මලාන


ප්‍රධාන කාර්යාලයට අදාල අංශ

1. ආයතන අංශය
2. මුදල් හා ගිණුම් අංශය
3. ප්‍රවාහන ඒකකය
4. ඉඩම් අංශය 01
5. ඉඩම් අංශය 02
6. ප්‍රසම්පාදන ඒකකය
7. ප්‍රධාන ගබඩාව

# 5. පරිච්ඡේදය
# සංවර්ධන කටයුතු

## 5.1 ඉඩම්

### 5.1.1. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර ලබා දීම





2018 වර්ෂය තුල ඉඩම් නොමැති පුද්ගලයින් සඳහා ඉඩම් බලපත්‍ර ලබාදීම යටතේ, බලපත්‍ර 10,000ක් ලබාදීමට ඉලක්ක කර  බලපත්‍ර 27,999 ක් ලබා දීමට හැකි වුණි. දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර 7,958 ක් ද, පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල විසින් බලපත්‍ර 20,041 ක් ද ලබා දෙන ලදි.

### 5.1.2. රජයේ ඉඩම් ආඥා පනත යටතේ  දීර්ඝ කාලීන බදුකර ලබාදීම

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් කෘෂිකාර්මික, නේවාසික, කාර්මික, වාණිජමය අවශ්‍යතාවයන් සඳහා රජයේ හා පුද්ගලික අංශයේ ආයතන වලට සහ පුද්ගලයින්ට මෙන්ම විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයෝජනවල නියැලීමට අපේක්ෂා කරන ආයෝජකයන් හට ඉඩම් ලබා දීම සිදු කරයි.

දීර්ඝ කාලීන බදුකර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ඉතා දීර්ඝ එකකි. එමගින් ප්‍රාදේශීය ලේකම්වරුන්, පළාත් ඉඩම් කොමසාරිස් / නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) හරහා නිර්දේශ වාර්තා සමඟ සියළුම ලියකියවිලි එවනු ලැබේ. ඒවා පරීක්ෂාකර ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් මගින්

අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර බදු දීමට අනුමැතිය ලබාගත යුතුය. විරෝධතා සඳහා ගැසට් පත්‍රයේ පලකර නියමිත කාලයෙන් පසුව බදු අය කර භුක්තිය භාරදීම සිදුකෙරේ. ඉන් අනතුරුව රේඛා චිත්‍ර ලබා ගෙන බදුකර සකස් කර ඉඩම් අමාත්‍යාංශය හරහා ජනාධිපති ලේකම් කාර්යාල වෙත යවා බදුකර අත්සන් කරවා ගෙන ප්‍රාදේශීය ලේකම් මඟින් ලියාපදිංචියට යවා ලියාපදිංචි කර බදුකර නිකුත් කෙරේ.




2018 වර්ෂය සඳහා දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලබාදීම යටතේ, අමාත්‍යාංශයට නිර්දේශ ලබාදීමේ ඉලක්කය 5000 ක් වූ අතර බලපත්‍ර 2196 ක් අමාත්‍යාංශයට නිර්දේශ සඳහා යවා ඇත. දීර්ඝ කාලීන බදුකර නිකුත් කිරීම යටතේ ඉලක්කය 1100 ක් වූ අතර බදුකර 410 ක් නිකුත් කිරීමට හැකියාව ලැබුණි. බදුකර පසු කටයුතු (පැවරීම්, උකස් කිරීම්) ඉලක්කය 100 ක් වූ අතර ප්‍රගතිය 129 ක් විය.

2018 වර්ෂයේ බදු නොගෙවා ඇති බදුකරුවන් සංඛ්‍යාව 160 ක් වූ අතර, බදුකරුවන් / අවසරපත්‍රලාභීන් දැනුවත් කිරීම හා හිඟ අයකිරීමට කටයුතු කිරීම් 142 ක් විය. තවද අවසර පත්‍ර / බදුකර අවලංගු කිරීම් 36 ක් විය.

## 5.1.3. ත්‍රිවිධ හමුදා හා පළාත් පාලන ආයතන සඳහා පැවරුම් නියෝග නිකුත් කිරීමට අමාත්‍යාංශ නිර්දේශ යැවීම

රජයේ ඉඩම් ආඥා පනතේ 27 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව වෙත හා සෑම ප්‍රාදේශීය බල මණ්ඩයකටම අතිගරු ජනාධිපතිතුමන් විසින් බලය පවරනු ලැබූ නිලධාරියා හෝ තැනැත්තා විසින් අත්සන් කරන ලද පැවරුම් නියෝගයකින් එම ආඥා පනතේ කාර්යයන් සඳහා ශ්‍රී ලාංකික සමාජවාදී ජනරජයට අයත් සියළුම නිශ්ල දේපල පැවරිය හැක. ඒ අනුව 2018 වර්ෂයේදී පැවරුම් නියෝග සකස් කිරීමේ ඉලක්කය 360 ක් වන අතර පැවරුම් නියෝග 81 සකස් කිරීමට සමත් වී ඇත.

## 5.1.4. දීමනා පත්‍ර නිකුත් කිරීම

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් පළාත් සභා වෙත රජයේ ඉඩම් කළමනාකාරිත්වය සම්බන්ධව යම් පරිපාලන බලතල ලබාදී තිබුණද රජයේ ඉඩම්වල අයිතිය බැහැර කිරීමේ ජනාධිපතිවරයා සතු නීතිමය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට සුවිශේෂී කාර්ය භාරයක් පැවරී ඇත. රජයේ ඉඩම්වල අයිතිය බැහැර කිරීමේදී ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ රන්බිම දීමනා පත්‍ර නිකුත් කිරීම, රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනා පත්‍ර නිකුත් කිරීම, නිදහස් දීමනා පත්‍ර නිකුත් කිරීම සහ විශේෂ දීමනා පත්‍ර නිකුත් කිරීම, පූජාභූමි දීමනා පත්‍ර නිකුත් කිරීම, සුනාමි දීමනා පත්‍ර නිකුත් කිරීම හා ඉඩම් ප්‍රදාන (විශේෂ විධි විධාන) පනත යටතේ නියාදන සාධන පත්‍ර නිකුත් කිරීම ප්‍රධාන තැනක් ගනී.

### 5.1.4.1. දෙපාර්තමේන්තුවලට ඉඩම් නිදහස් කිරීම

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් විවිධ රාජ්‍ය ආයතන හා විවිධ දෙපාර්තමේන්තු අවශ්‍යතාවයන් සඳහා ඉඩම් නිදහස් කිරීම වාර්ෂිකව සිදු කරනු ලබයි. පසුගිය වර්ෂ කිහිපයක එය සිදුකල ආකාරය පහතින් දක්වා ඇත.


| වර්ෂය | **2016** | **2017** | **2018** |
|---|---|---|---|
| ඉලක්කය | 250 | 250 | 400 |
| ප්‍රගතිය | 340 | 378 | 348 |

දෙපාර්තමේන්තුවලට ඉඩම් නිදහස් කිරීම 2018 වර්ෂයේ ඉලක්කය 400 ක් වූ අතර නිදහස් කිරීම් 348ක් දක්වා කිරීමට හැකි විය.

### 5.1.4.2. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනා පත්‍ර නිකුත් කිරීම

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර නිකුත් කර ඇති ඉඩම් සංවර්ධනය කළ පසුව ස්ථිර අයිතියක් ලබාදීම සඳහා කොන්දේසි වලට යටත්ව රන්බිම දීමනාපත්‍ර නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුව මඟින් මෙහෙයවන ප්‍රධාන වැඩසටහනක් ලෙස ක්‍රියාවට නගා ඇත.

රන්බිම දීමනාපත්‍ර ලබාදීම
2016 - 2018





2018 වර්ෂය තුළ රන්බිම දීමනා පත්‍ර 7,800 ක් නිකුත් කිරීමට සැළසුම් කළ අතර වසර අවසන් වන විට දීමනා පත්‍ර 9,235 ක් නිකුත් කිරීමට හැකියාව ලැබිණි.

### 5.1.4.3. නිදහස් දීමනාපත්‍ර (රජයේ ඉඩම් ආඥා පනත යටතේ ) ලබා දීම

දීර්ඝ කාලීන බදුකර හෝ ප්‍රාරම්භක බදුකර සහිතව බෙදාදී ඇති ඉඩම් සඳහා ස්ථිර අයිතිය සහිත නිදහස් දීමනා පත්‍රයක් ලෙස මහජනතාවට භුක්ති විදීම සඳහා ලබාදීම මෙහිදී සිදු කරනු ලබයි. එහෙත් වාණිජ කටයුතු සඳහා අතිවිශේෂ අවස්ථාවකදී හැර මෙවැනි දීමනාපත්‍ර ලබා දෙනු නො ලැබේ.


නිදහස් දීමනාපත්‍ර ලබාදීම
2016 - 2018



2018 වර්ෂය තුළ නිදහස් දීමනා පත්‍ර 1000 ක් දීමට සැලසුම් කළ අතර වසර අවසන් වන විට දීමනා පත්‍ර 591 ක් නිකුත් කිරීමට හැකියාව ලැබුණු අතර නිදහස් දීමනාපත්‍ර සඳහා අමාත්‍යාංශ නිර්දේශ ඉදිරිපත් කිරීමේ ඉලක්කය 1000 වූ අතර 689 ක් නිර්දේශ සඳහා ඉදිරිපත් කර ඇත.

## 5.1.4.4. ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ දීමනා පත්‍ර ලබාදීම (නියාදන සාධන පත්‍ර නිකුත් කිරීම)

1979 වර්ෂයේ සිට මෙම පනත ක්‍රියාත්මක වේ. මෙම පනතට අනුව බෙදා දෙනු ලබන්නේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරා ගනු ලැබූ ඉඩම් වලින් ඉඩම් නොමැති පවුල් සඳහා බෙදා දීම පිණිස රජයට නිදහස් කරනු ලබන ඉඩම් වේ. කිසිදු ඉඩම් කැබැල්ලක අයිතියක් නොමැති දුප්පත් ජනතාව වෙත මේ යටතේ ඉඩම් ලබා දෙනු ලැබේ.




2018 වසරේ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ නියාදන සාධන පත්‍ර 350 ක් නිකුත් කිරීමට සැලසුම් කර තිබූ අතර නියාදන සාධන පත්‍ර 287 ක් නිකුත් කිරීමට හැකි විය.

## 5.1.4.5. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ මධ්‍යම පාන්තික දීමනා පත්‍ර ලබා දීම


ඉඩම් සංවර්ධන ආඥා පනත මගින් සම්මත කර ඇත්තේ ඉඩම් අහිමි ගොවි පාන්තිකයින්ට පමණක් නොව යම් මූල්‍ය හෝ ප්‍රාග්ධන හැකියාවක් හිමි පුරවැසියන්ට ද රජයේ ඉඩම් කැබැල්ලක් ලබාදී එම ඉඩම් කැබැල්ල සංවර්ධනය කොට ජාතික නිෂ්පාදිතයට සක්‍රියව දායකකර ගැනීම සඳහා වන ක්‍රමවේදයක් සකස් කිරීමයි. ඒ අනුව මධ්‍යම පාන්තිකයින්ට රජයේ ඉඩම් කැබැල්ලක් ලබාදීම යටතේ එක් අයෙකුට අක්. 10, 25ක් හෝ අක්.50ක් වැනි විශාල බිම් ප්‍රමාණයක් ලබාදීම සිදුකරයි.

2018 වසරේදී මධ්‍යම පාන්තික දීමනා පත්‍ර 55 ක් ලබා දීමට ඉලක්ක කොට තිබූ අතර, දීමනා පත්‍ර 70 ක් ලබා දීමට හැකි විය.

### 5.1.4.6. සුනාමි දීමනා පත්‍ර ලබා දීම

සුනාමි අවතැන්වූවන් සඳහා විකල්ප ඉඩම් හඳුනාගෙන නොමිලේ නිදහස් දීමනාපත්‍ර ලබාදීම 2007 වර්ෂයේ සිට සිදු කරන ලද අතර, ඒ අනුව 2018 වර්ෂය වන විට දීමනාපත්‍ර 935 ක් ලබා දී ඇත.


| වර්ෂය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| ඉලක්කය | 1000 | 500 | 1100 |
| ලබාදුන් දීමනාපත්‍ර සංඛ්‍යාව | 541 | 1512 | 935 |




2018 වර්ෂයේ සුනාමි දීමනා පත්‍ර 1100 ක් දීමට සැලසුම් කළ අතර වසර අවසන් වන විට දීමනා පත්‍ර 935 ක් ලබාදීමට හැකියාව ලැබුණි.

### 5.1.4.7. පූජා භූමි දීමනා පත්‍ර ලබා දීම

බෞද්ධ විහාරස්ථානවල පැවැත්ම උදෙසා නිදහස් දීමනා පත්‍ර ලබාදීම, වර්ෂයක් පාසා සිදුකරනු ලබන කටයුත්තකි. ප්‍රවර්තන වර්ෂය තුළද එම කටයුතු සිදු වූ ආකාරය පහතින් දක්වා ඇත.




2018 වර්ෂය තුළ පූජා භූමි දීමනා පත්‍ර 100 ක් දීමට සැලසුම් කළ අතර වසර අවසන් වන විට දීමනා පත්‍ර 73 ක් ලබාදීමට හැකියාව ලැබුණි.


### 5.1.5. ඉඩම් ගැටළු විසඳීම හා උපදෙස් සැපයීම

ඉඩම් ලාභීන්ගේ ඉඩම් ගැටළු විසඳීම හා උපදෙස් සැපයීම, කොට්ඨාස දින පැවැත්වීමේ වැඩසටහනත් ජංගම සේවා පැවැත්වීමේ වැඩසටහනත් ක්‍රියාත්මක කෙරුණි. මීට අමතරව අන්තර් පළාත් හා පළාත් සභා මට්ටමින් යොමුවන ඉඩම් ගැටළු වලට නීතිමය සහ තාක්ෂණික සහාය ලබා දීම ද දෙපාර්තමේන්තුව විසින් ලබාදෙයි.

2018 වර්ෂය තුළ දී ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ උපදෙස් ලබා දීම් 9,365 ක් සිදු වූ අතර රජයේ ඉඩම් ආඥා පනත යටතේ උපදෙස් ලබා දීම් 11,968 ක් සිදු වුණි.

## 5.1.6. ආයෝජන කටයුතු සඳහා ඉඩම් ලබාදීම

මධ්‍යකාලීන හා දිගුකාලීන ආයෝජන අවස්ථා සඳහා රජය සතු ඉඩම් ලබාදීම සිදුකරයි.





2018 වර්ෂය තුළ ආයෝජන අවස්ථා පුළුල් කිරීමේ පරමාර්ථයෙන් ඉඩම් ලබාදීම සඳහා විශේෂ සංවර්ධන ආයෝජන ව්‍යාපෘති වෙනුවෙන් දිගු කාලීන බදු සඳහා නිර්දේශ අමාත්‍යාංශයට යැවීම් 10 ක් ඉලක්ක කොට තිබූ මුත් ඉල්ලීම් අඩුවීම නිසා නිර්දේශ යැවීම් 02 ක් පමණක් සිදුකර ඇත.

## 5.1.7. රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම

රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම් පාලනය කිරීමට විවිධ පියවර ගෙන ඇත. මේ සඳහා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හා එක්ව දිවයිනේ පිහිටි සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රදේශීය ලේකම් කාර්යාල ඒකාබද්ධව ජාතික වැඩපිළිවෙලක් 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරයි. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2013.07.05 දින නිකුත් කල අංක HAF/03/ADMIN/002 දරණ චක්‍රලේඛයට අනුව දිවයිනේ සෑම ග්‍රාම නිලධාරි වසමකම සෑම ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයකම අනවසරයෙන් අල්ලා ගැනීම් පාලනය පිළිබඳව විමර්ෂණයක් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් ආරම්භ කර ඇත. මෙහිදී අනවසරකරුවන් හඳුනා ගෙන ඔවුන් ඉඩම් වලින් ඉවත් කිරීම, ඉවත් නොවන අනවසරකරුවන් හට නඩු පැවරීම මගින් මෙම කටයුතු සිදුකර ඇත. 2018 වර්ෂය තුල එවැනි ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීම් සිදුකරනු ලැබූ ආකාරය පහත දක්වා ඇත.

ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම් පාලනය කිරීම
2016 - 2018




2018 වර්ෂයේ අනවසර අල්ලා ගැනීම් 4315 ක් වාර්තා වූ අතර ඉන් 124 ක් ඉඩම්වලින් ඉවත් කිරීමටත් තවත් 43 දෙනෙකු සඳහා නඩු පැවරීමටත් හැකියාව ලැබී ඇත. අනවසරකරුවන් 3864 ක් වෙනුවෙන් තවදුරටත් ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

## 5.1.8. ජංගම සේවා පැවැත්වීම

ඉඩම් ලාභීන්ගේ ඉඩම් ආශ්‍රිතව පැනනැගී ඇති ගැටළුවලට රාජ්‍ය නිලධාරීන්ගේ මැදිහත්වී ප්‍රාදේශීය මට්ටමින් ඊට විසඳුම් ලබා දීමේ ක්‍රියාවලිය ජංගම සේවා වැඩසටහන ලෙස හැඳින්වේ. 2018 වර්ෂය තුළ ජංගම සේවා වැඩසටහන් 100 පැවැත්වීමට ඉලක්ක කළ අතර ජංගම සේවා 95 පැවැත්වීමට සමත් විය. එහිදී ඉඩම් ගැටළු 2,230 ක් සඳහා උපදෙස් ලබා දීමට සමත් වී ඇත.

## 5.1.9. සංචාරක බංගලා , නිල නිවාස හා කාර්යාල වැඩි දියුණු කිරීම

අන්තර් පළාත් වාරි මාර්ග හා ජනාවාස ව්‍යාපෘතීන්හි අභ්‍යන්තර නිළධාරී නිල නිවාස හා කාර්යාලීය ගොඩනැගිලි පුනරුත්ථාපනය, අළුත්වැඩියා කටයුතු කිරීම වර්ෂිකව සිදුකරනු ලබයි. ඒ අනුව 2018 වසරේ දීද එම කටයුතු සිදු කෙරිණි. එහිදී සංචාරක බංගලා, නිල නිවාස හා කාර්යාලීය ගොඩනැගිලි 2ක් අළුත් වැඩියා කිරීමට සැලසුම් කල අතර එම සියළු වැඩ නිමකිරීමට හැකි වූ අතර ඒ සඳහා රු. 13,975,925.43 ක මුදලක් වැය කෙරිණි.

## 5.1.10. රාජ්‍ය ඉඩම් තොරතුරු හා කළමණාකරන පද්ධතිය ක්‍රියාත්මක කිරීම

රජයේ ඉඩම් කළමනාකරණ කටයුතු කාර්යක්ෂම කරලීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් රජයේ ඉඩම් තොරතුරු කළමණාකරණ පද්ධතිය (State Land Information Management Systsem) නිර්මාණය කිරීමට කටයුතු කර ඇත. රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙම පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු සිදු කරන අතර ඉඩම් බෙදාදී ලියකියවිලි නිකුත් කිරීම හා ආදායම් රැස්කිරීමේ ක්‍රියාවලියද බෙදා දුන් ඉඩම් වලට අදාළ පසු කටයුතු හා අධීක්ෂණ කටයුතු ද මෙම පද්ධතිය මඟින් සිදු කිරීමට හැකියාව ඇත. 2013 වර්ෂයේ දී බස්නාහිර පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 40 කින් ආරම්භ වූ මෙම වැඩ සටහන 2018 වර්ෂය අවසන් වන විට දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 332ක් පුරා සාර්ථකව ක්‍රියාවට නැගීමට හැකි විය.

| වර්ෂය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| ඉඩම් ලේඛන ඇසුරින් තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීම් (ලේඛණ සංඛ්‍යාව) | 415,606 | 231,021 | 236,326 |
| අනුරේඛණ සහිතව ඉඩම්වල ක්ෂේත්‍ර තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම් (ඉඩම් කැබලි සංඛ්‍යාව) | 83,016 | 93,911 | 32,876 |
| නව දීමනා පත්‍ර ලබාදීම | 4,237 | 5,075 | 4,387 |
| **එකතුව** | **502,859** | **330,007** | **273,589** |

2018 වර්ෂය තුල රාජ්‍ය ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට ඇතුලත් කිරීම යටතේ ඉඩම් ලේඛන 300,000ක් ඇතුලත් කිරීමට ඉලක්ක කර, ලේඛණ 236,326 ක් ඇතුලත් කිරීමට දෙපාර්තමේන්තුව සමත් වීය. මීට අමතරව මෙම වර්ෂයේදී ද දීමනාපත්‍ර, වාර්ෂික අවසරපත්‍ර, දීර්ඝ කාලීන බලපත්‍ර ආදී සියලු ලේඛණ මෙම පද්ධතිය උපයෝගි කර ගනිමින් මුද්‍රණය කිරීම සිදුකර ඇත. ඒ අනුව දිමනාපත්‍ර පමණක් 4,387 ක් නිකුත් කිරීමට හැකි වුණි.


## 5.2 ඉඩම් බදු ආදායම ඇස්තමේන්තු කිරීම හා රැස්කිරීම

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව රැස්කල යුතු ඉඩම් බදු ආදායම් පිළිබඳව පුරෝකථනයන් කිරීම වර්ෂය ආරම්භයේදී සහ වසර මැදදී සිදුකරනු ඇත. මෙම පුරෝකථනයන් දෙස බැලීමේදී වාර්ෂිකව රැස්කල යුතු ඉඩම් බදු ආදායම් ප්‍රමාණය ඉහළ ගොස් ඇත. මෙම තත්ත්වය රාජ්‍ය ආදායම ඉහළ යාමේ ප්‍රවණතාවයක් ද වේ. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වාර්ෂිකව රැස්කල යුතු ඉඩම් බදු ආදායම් පිළිබඳව පුරෝකතනයන් කිරීමේදී නව බදු ආදායම් රැස්කිරීම් සහ හිඟ බදු ආදායම් රැස්කිරීම් ලෙස වෙන් වෙන් ලෙස ගණනය කරනු ඇත.

සමස්තයක් ලෙස මෙම බදු ආදායම් දෙයාංශයම එක්ව ගත්කල රැස්කල යුතු බදු ආදායම් ප්‍රමාණය වාර්ෂිකව ඉහළ ගොස් ඇත. මෙම ප්‍රවණතාවය පසුගිය වර්ෂ කිහිපයක බදු ආදායම් රැස්කිරීම් දෙස බැලීමේ දී අවබෝධ වනු ඇත. ඉඩම් නව බදුදීම ප්‍රමාණාත්මක වශයෙන් ඉහල යාමත් ඉඩම් වල තක්සේරු වටිනාකම් ඉහල යාමත් මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත. තවද නාමික වටිනාකම මත සහනදායී බදුදීම් අඩුවීමත් එකතු කිරීම විධිමත් වීමත් තවත් හේතු ලෙස දැක්විය හැක.

**බදු ඇස්තමේන්තුව හා රැස් කළ බදු ආදායම 2016 -2018**

| | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| බදු ඇස්තමේන්තුව (රු) | 45,000,000.00 | 46,000,000.00 | 65,000,000.00 |
| වර්ෂයේ බදු ආදායම (රු) | 64,197,521.90 | 70,132,249.15 | 55,324,037.41 |



**5.3. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට අනුයුක්ත ආයතන පිළිබඳ තොරතුරු පහතින් දැක්වේ.**

| ප්‍රාදේශිය කාර්යාලය | දුරකථන අංකය |
|---|---|
| එස්.එන්.ජී. අබේසේකර මිය<br>ඉඩම් කොමසාරිස්<br>ඉඩම් කොමසාරිස් කාර්යාලය - අනුරාධපුර | 025-2222735 |
| කේ.එච්.එම්.ඩී. විජේවර්ධන මයා<br>සහකාර ඉඩම් කොමසාරිස්<br>ඉඩම් කොමසාරිස් කාර්යාලය - පොළොන්නරුව | 027-2222328 |
| ඩී.ඩී.එස්.තක්ෂිලා ගුණරත්න / ඒ.එල්.අයි. හානු මිය<br>සහකාර ඉඩම් කොමසාරිස්<br>ඉඩම් කොමසාරිස් කාර්යාලය - අම්පාර | 063-2222523 |
| ඩබ්.එච්.ඒ.එස්. නදිෂානි මෙය<br>සහකාර ඉඩම් කොමසාරිස්<br>ඉඩම් කොමසාරිස් කාර්යාලය - දෙබරවැව | 047-2237273 |
| ආර්.එම්.එන්.සී. හේමකුමාර මයා<br>සහකාර ඉඩම් කොමසාරිස්<br>ඉඩම් කොමසාරිස් කාර්යාලය - මහියංගණය | 055-2257031 |
| කේ.බී. නිජාහරන්<br>සහකාර ඉඩම් කොමසාරිස්<br>ඉඩම් කොමසාරිස් කාර්යාලය - ත්‍රිකුණාමලය | 026-2222234 |
| වයි.වයි.එන්. පෙරේරා<br>සහකාර ඉඩම් කොමසාරිස් (වැ.බ.)<br>සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය - මොණරාගල | 055-2277426 |
| පී.ජම්පුදා<br>සහකාර ඉඩම් කොමසාරිස්<br>සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය - කන්තලේ | 026-2234235 |

- සකස් කළේ :- ආර්.ඒ.එන්. පෙරේරා - තොරතුරු තාක්ෂණ සහකාර
- පරීක්ෂා කළේ :- එන්. ලක්මාලි - සංවර්ධන නිළධාරි
- නිවැරදි බව තහවුරු කළේ :- කේ.ඒ.කේ.ඩබ්. පෙරේරා - සහකාර ඉඩම් කොමසාරිස් (ආයතන)
- නිර්දේශ කළේ :- සුසීමා කාරියවසම් - ඉඩම් කොමසාරිස් (පාලන)